20
APR

Non-Academic Vacancies (Open Recruitments) – University of Sri Jayewardenepura

20TH APRIL 2026 / VACANCIES

පුරප්පාඩු

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් **2026.04.20** දින සිට **2026.05.04** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය) – ස්ථිර පදනම මත
Library Information Assistant (Grade III) on Permanent Basis

සුදුසුකම් :-

- අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී,
  - සිංහල භාෂාව/දෙමළ භාෂාව
  - ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
  - ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එක් වරකදී සමත් වීම.

සහ

- අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ අර්ධ / පූර්ණ සුදුසුකම් ලබා තිබීම හෝ ශිෂ්‍යභාවය ලබා තිබීම.

සහ

(ආ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලසීමාවකින් යුතු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකම් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- රු. **49,475-17×540 – 58,655** (මාසික) **U-MN 1(III)**

බඳවා ගැනීම :- පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

කොන්ත්‍රාත් පදනම මත සැලසුම් ශිල්පී
Draughtsman on Contract Basis

සුදුසුකම් :-

- රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැලසුම් ශිල්පිය පිළිබඳ විභාගය සමත්ව තිබීම.

වැටුප් පරිමාණය :- රු. 68,895/- (දීමනා සමඟ)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොන්ත්‍රාත් පදනම මත නිදර්ශක එකතු කරන්නා
Specimen Collector on Contract Basis

සුදුසුකම් :-

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ නිදර්ශක එකතුකරන්නා කාර්යයට අදාල තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් V.Q 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද.

වෙනත් :-

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 62,375/- (දීමනා සමඟ)

බඳවා ගැනීම :- වෘත්තිය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොන්ත්‍රාත් පදනම මත විද්‍යාගාර සහායක
Laboratory Attendant on Contract Basis

සුදුසුකම් :-

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාල තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තිය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකම් V.Q 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

- අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද.

වෙනත් :-

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය :- රු. 62,375/- (දීමනා සමඟ)

බඳවා ගැනීම :- වෘත්තිය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

කොන්ත්‍රාත් පදනම මත සෞඛ්‍ය සේවා කම්කරු
Health Services Labourer on Contract Basis

සුදුසුකම් :-

- අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිට තිබිය යුතුයි

වෙනත් :-

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් :- රු. 60,575.00 (දීමනා සමඟ)

බඳවා ගැනීම :- වෘත්තිය පරීක්ෂණයක් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සේවා පැවරුම් පදනම මත පරිපාලක (යාන්ත්‍රික / විදුලි / ජලනල)
Supervisor (Mechanical/Electrical/Plumbing) on Assignment Basis

සුදුසුකම් :-

- ජාතික තාක්ෂණ සහතික හෝ සමාන සුදුසුකම් සමඟ වසර තුනක (03) සේවා පළපුරුද්ද (සේවා පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව හැදෑරීමේ කාලය තුල දී ලබා තිබීම.)

හෝ

- දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගය විෂයයන් 06ක් සමත් වීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරිපාලකයෙකු වශයෙන් වසර 05ක පළපුරුද්දක් තිබීම.

වැටුප :- රු. 75,000/- (දීමනා සමඟ)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සටහන **:** අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

අයදුම්පත් මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා මාර්ගගත ද්වාරය (Online Portal) **2026.04.20** දින සිට **2026.05.04** දින දක්වා විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://www.sjp.ac.lk/vacancies වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://hrms.sjp.ac.lk/vacancies/nonacademic/open වෙත පිවිසිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ උඩුගත (Upload) කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතික වල ඡායා පිටපත් උඩුගත (Upload) කර නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදු වේ.

අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පෙර තොරතුරුවල නිවැරදි බව තහවුරු කරගත යුතු වේ. සාවද්‍ය තොරතුරු හෝ අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.
2026.04.10